# මියන්මාරයේ ශ්වේදගෝන් ස්තූපය හා උප්පටසන්ති ස්තූපය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

කැලණියේ ධම්මගවේසී හිමි[1]

මුඛ්‍ය පදඃ උප්පටසන්ති, ශ්වේදගෝන්, ස්තූපය, නෙපිඩෝ අගනුවර, මියන්මාරය

## හැඳින්වීම

මියන්මාරයේ ඉතා විශිෂ්ට බෞද්ධ ස්තූපයන් ද්විත්වයක් ලෙස යැංගුන් නගරයේ ශ්වේදගෝන් ස්තූපය හා නෙපිඩො නව අගනුවර උප්පටසන්ති ස්තූපය හැඳින්විය හැකිය. වාස්තු විද්‍යාත්මකව ගත් කළ මෙම ස්තූප ද්විත්වයේ සමානාත්මතාවයක් ඇති නමුත් ඓතිහාසික, ආගමික, දේශපාලනික තොරතුරු අධ්‍යනයේ දී වෙනස්කම් රාශියක් පවතී. ශ්වේදගෝන් ස්තූපය අතීතයේ පහළ වූ සිව් බුදුවරුන් විසින් පරිභෝග කරන ලද පූජනීය ස්ථානයක් ලෙසට හා ගෞතම බුදුරදුන් ධරමාන සමයේදීම කේශ ධාතූන් තැන්පත්ව ගොඩනගා ඇති බව සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනයේ දී තහවුරු වේ. උප්පටසන්ති ස්තූපය නිර්මාණය තුළ නෙපිඩෝ අගනුවර රාජ්‍ය බලය, සංස්කෘතික නිර්මාණ හා ආගමික වපසරිය තහවුරු කිරීම උදෙසා සාමාජීය හා දේශපාලනික භූමිකාවන්ගේ බලපෑම විද්‍යමාන කරයි. ශ්වේදගෝන් යන්නෙහි අර්ථය සිව් බුදුවරුන්ගේ පූජනීයත්වය උසුලන ධාතූන් හා පාරිභෝගික වස්තූන් තැන්පත් හෙයින් හා රන් කන්දෙහි ස්තූපය යන අරුතයි. උප්පටසන්ති යනු "සන්සුන් වීම සඳහා ආධාරය" යන අර්ථයයි. ක්‍රි.පූ. 6 වැනි සියවසේ ඉදිකළ ශ්වේදගෝන් ස්තූපය හා වර්ෂ 2009 නිමවූ උප්පටසන්ති ස්තූපයෙහි පවත්නා ඓතිහාසික, සංස්කෘතික හා බුරුම දාගැබ් කලාවෙහි පවත්නා සුවිශේෂිත්වය පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණයේ දී සිදු කරනු ලැබේ.

ශ්වේදගෝන් ස්තූපය හා උප්පටසන්ති ස්තූපය මගින් මියන්මාරයේ බෞද්ධාගමික තත්තවය, දේශපාලන නිරූපණය හා ජාතික අනන්‍යතාවය විෂයෙහි බලපා ඇත්තේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. එහිලා ශ්වේදගෝන් ස්ථූපයෙහි ඉතිහාසය හා බෞද්ධාගමික සංකේතයක් ලෙස භාවිතා වීමේ වැදගත්කම, උප්පටසන්ති ස්තූපය මගින් පෙන්වා දෙනු ලබන්නේ නව රාජ්‍යක බෞද්ධ සංකේතයක් ස්ථුට කිරීමක් ද යන්න හා මෙම ස්තූප ද්විත්වය යොදා ගනිමින්

---

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය
Kelaniyadhammagavesi@gamail.com

මියන්මාරයේ බෞද්ධ කේන්ද්‍රස්ථානය යොදා ගන්නේ කෙසේ ද යන්න අතුරු ගැටලු වශයෙන් දැක්විය හැකිය. ශ්වේදගෝන් ස්තූපය හා උප්පටසන්ති ස්තූපය මඟින් අනාවරණය වන ඓතිහාසික පසුබිම, රාජ්‍ය කාලය, ජාතික අනන්‍යතාවය, වාස්තු විද්‍යාත්මක බලපෑම කෙසේ නිරූපණය වන්නේ දැයි ඉදිරිපත් කිරීම මෙහි පර්යේෂණ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන අතර මෙම ස්තූප ද්විත්වය හා බැඳී බෞද්ධ සාහිත්‍ය කෘති, ඉතිහාස වාර්තා, සඟරා හා ලිපි භාවිතා කරන ලදි. ඉතිහාසය, වාස්තු විද්‍යාව, ආගමික පදනම, දේශපාලනික තත්තවය ඔස්සේ සමානකම් හා වෙනස්කම් පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනය කර ඇත. එමෙන්ම මියන්මාරයේ බෞද්ධ භික්ෂූන් හා විෂයෙහි ප්‍රාමාණිකයන් සමග සම්මුඛ සාකච්ඡාද පවත්වන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්වේදගෝන් ස්තූපය හා බැඳි බෞද්ධ සංස්කෘතිය පිළිබඳ Michael - Aung - Thwin විසින් "The Mists of Ramanna, the legand that was Lower Burma" කෘතියේ දී ඉදිරිපත් කොට ඇත. එමෙන්ම උප්පටසන්ති ස්තූපය හා බැඳි නවීන රාජ්‍ය සංකේතය පිළිබඳ ඉදිරිපත් කරමින් David Steinberg විසින් "Myanmar : What Everyone Needs to Know" කෘතියේ උප්පටසන්ති ස්තූපය හා බැඳි නව ආගමික ප්‍රස්තුතය හා දේශපාලනික තත්තවය ඉදිරිපත් කරයි. මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියන්ගේ බුරුමයේ බෞද්ධ සම්ප්‍රදාය හා ලංකාවේ බලපෑම පිළිබඳ කෘතියේ ද ශ්වේදගෝන් ස්තූපය පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයයි. එනමුත් මෙතෙක් සිදු කළ ගවේෂණයන්ට අනුව ශ්වේදගෝන් ස්තූපය හා උප්පටසන්ති ස්තූපය පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනයක් සිදු කොට නොමැත.

ශ්වේදගෝන් ස්තූපය වනාහි පෞරාණික ධාතූන් තැන්පත් කොට බෞද්ධයාගේ ආධ්‍යාත්මිකත්වය හා පූජනීයත්වය උදෙසා නිර්මාණය වූ බෞද්ධ සංකේතයකි. කලාත්මක රන් ආවරණය සහිත ඉහළට ගොස් ඇති දාගැබ යැංගුන් නුවර හාත්පස ප්‍රතාපවත් සංලක්ෂණයක් වීමට උපයෝගී වී ඇත. හෙතෙම මියැන්මාරයේ බෞද්ධ හදවත ශ්වේදගෝන් ස්තූපය යි. උප්පටසන්ති ස්තූපය නවීන රාජ්‍ය අගනුවර තුළ ඉදිකළ රාජ්‍ය සංකේතයක් ලෙස දැක්විය හැකිය. නව මිලටරි රාජ්‍ය අභිලාෂයන් හා රාජ්‍යත්වය ඔස්සේ ආගමික නවෝත්පාදනයට උප්පටසන්ති ස්තූපය හේතු වී ඇත. වත්මන් නෙපිඩෝ අගනුවර රාජ්‍ය බලය තහවුරු කරමින් පවත්නා බැවින් ඊට පෙර අගනුවර වූ යංගුන් නුවර ශ්වේදගෝන් ස්තූපය මෙන් උප්පටසන්ති ස්තූපය නව බෞද්ධාගමික හා දේශපාලනික මුහුණුවරක් ඉදිරිපත් කරයි. සංචාරක ආකර්ෂණය දිනා ගැනීම ඔස්සේ නව

අගනුවර ජාත්‍යන්තර පිළිගැනීමකට ලක් කිරීම උදෙසා උප්පටසන්ති ස්තූපය ප්‍රධාන ගොඩනැගිල්ලක් ලෙස ඔසවා තැබීමේ ප්‍රයත්නයක් යැයි අනුමාන කළ හැකිය. නෙපිඩෝ අගනුවර නව නගර සැලසුමක් බැවින් ජාතික සංකේතය ලෙස ශ්වේදගෝන් ස්තූපයට මෙන් ගෞරවාන්විත බවක් උප්පටසන්ති ස්තූපයෙන් පෙන්නුම් කිරීමට ගත් ප්‍රයත්නයක් ලෙස ද දැක්විය හැකිය. වාස්තු විද්‍යාත්මකව ස්තූප ද්විත්වයම සමාන අතර උස මීටර් 99 කින් යුක්ත වේ. ඝණ්ඨාකාර ආකෘතියෙන් යුක්තව ස්තූප ද්විත්වය නිර්මාණය කොට ඇත. එමෙන්ම සිව් බුදුවරුන්ට (කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම) බුදුවරුන්ට කැප කොට ඉදිකර ඇත. ශ්වේදගෝන් ස්තූප පරිශ්‍රය නිතර ජනාකීර්ණ පරිශ්‍රයක් වුව ද උප්පටසන්ති ස්තූප පරිශ්‍රය එලෙස ජනාකීර්ණ නොවේ. උප්පටසන්ති ස්තූපයේ ගර්භයට ප්‍රවිෂ්ට විය හැකි නමුත් ශ්වේදගෝන් ස්තූපයෙහි ගර්භ ගෘහයට ඇතුල්වීමක් නොමැත. එමගින් සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට ඇතුළත විචිත්‍රවත් කලාංග නිර්මාණය කොට තිබීම ප්‍රකට ලක්ෂණයකි. මියන්මාර බෞද්ධ උරුමය තුළ ශ්වේදගෝන් ස්තූපය අසහාය පූජනීයත්වය, සංස්කෘතික වටිනාකම, පෞරාණික දේශීය අභිචාර හා බෞද්ධ අභිචාර විධි, ඓතිහාසික ප්‍රස්තුත ගණනාවකින් වැදගත් වී ඇති නමුත් උප්පටසන්ති ස්තූපය නව මිලටරි පාලනය හමුවේ රාජ්‍ය බලය නිර්මාණය කිරීමේ මිථ්‍යා ප්‍රතිඵලයක් ලෙසද ඇතමුන් දක්වයි. උප්පටසන්ති ස්තූපය අසල ශ්වේත හස්තින්ගේ උද්‍යානය ද රාජ්‍යත්වයේ බලය ආගමික හා දේශපාලන න්‍යාය උපයෝගී කරගනිමින් සාම්ප්‍රදායිකව ඉදිරිපත් කිරීම විෂයෙහි ද උපයෝගී වී ඇත. යම් ස්තූපයක් පූජනීයත්වයට පත්වීමට නම් එහි බුදු රදුන්ගේ අනෙකුත් ශ්‍රාවකයන්ගේ භස්මාවශේෂ (ධාතූන්) ඇතුළත් විය යුතු නමුදු උප්පටසන්ති ස්තූපයෙහි එවැනි ධාතු නිධානයක් පිළිබඳ ඉදිරිපත් නොවීම පූජනීයත්වයට වඩා සංස්කෘතික හා ජාතික සංකේතයක් ලෙස යොදා ගත් මෙවලමක් ලෙසින් හඳුන්වා දිය හැකිය. එනමුත් ශ්වේදගෝන් ස්තූපය වර්තමානය දක්වාම දෙස් විදෙස් බෝහෝ දෙනාගේ ආකර්ෂණය හා ගෞරවාදරය දිනා ගැනීමටත්, සමස්ත මියන්මාරයේ ජාතික සංකේතයක් මෙන්ම ලෝක උරුමයක් ලෙස සම්භාවනාවට පාත්‍ර වී තිබීම ප්‍රමුඛත්වයෙන් දැක්විය හැකිය.

## සමාලෝචනය

ශ්වේදගෝන් ස්තූපය හා උප්පටසන්ති ස්තූපය ථෙරවාද බෞද්ධ සංකේත අතර ඓතිහාසික, සංස්කෘතික හා දේශපාලනික ස්වභාවයන්ගෙන් වෙනස්වීමට භාජනය වේ. ශ්වේදගෝන් ස්තූපය පෞරාණික බෞද්ධ උරුමයක් ලෙස මියන්මාර් වැසියාගේ පූජනීයත්වයට පත්වී තිබුණ ද උප්පටසන්ති ස්තූපය නවීනත්වය නිරූපණය කරමින් වත්මන් රාජ්‍ය සංකේතය ලෙස නිල නොලත් විරුදාවලියක් ලබයි.

ආශ්‍රිත මූලාශ්‍රය

අභයතිස්ස, මැදගොඩ. (2012). ***බුරුමයේ බෞද්ධ සම්ප්‍රදාය හා ලංකාවේ බලපෑම.*** කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මුණසිංහ, කුමාරසිරි. (2010), ***ශ්‍රී ලංකාවේ සහ මියන්මාරය අතර බෞද්ධ සබඳතා,*** පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

Myanmar Ministry of Religious Affairs, (2009), ***Uppatasanti pagoda; A Modern Symbol of Faith***, Nay pyi taw, Department of Religious Affairs.

Mann u. Shwe, 2008, ***The Golden Pagodas of Myanmar Yangoon***, Mingalar press.

Aung Thwin. Michael, 2005, ***The Mists of Ramanna***, The Legend that was Lower Burma.